ලුම්බිණි විද්‍යාලයිය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය | CRI Confucius Center Lumbini College | 国际台斯里兰卡兰比尼广播孔子课堂

友誼橋 මිතුරුසර

Voice of Friends

中国国际广播电台长期致力于加强中斯两国友谊、传播两国语言文化。

චීනය හා ශ්‍රී ලංකාව අතර මිත්‍රත්වය ශක්තිමත් කරමින් දෙරටේ භාෂා හා සංස්කෘතිය හුවමාරු කිරීමට CRI ...

UIBE සංස්කෘතික කණ්ඩායම් සංදර්ශනය, ලුම්බිණි විද්‍යාලයේදී හා ටවර් රඟහලේදී පැවැත්විණි.
මෙම අවස්ථාව සඳහා රජයේ මැති ඇමතිවරුන් ඇතුළු විශාල පිරිසක් එක්වී සිටියහ.

Organize By 承办

Embassy of the Peoples Republic of China to Sri Lanka 中华人民共和国驻斯里兰卡大使馆
CRI Confucius Center Lumbini College 国际台斯里兰卡兰比尼广播孔子课堂
Listener's Association CRI Sri Lanka 国际台斯里兰卡听众协会
CRI Sri Lanka FM 102 国际台斯里兰卡调频台FM102

තවදුරටත් ශක්තිමත් වන
චීන මිත්‍ර සබඳතාවය......

ශ්‍රී ලංකාව හා චීනය අතර මිත්‍ර සබඳතාවයට ඉතා දිගු ඉතිහාසයක් තිබේ. මෙය සමාජ, සංස්කෘතික, ආර්ථික, අයතනික බැඳීමකි. පාහියන් භික්ෂුව මෙන්ම හියුත්සාන් භික්ෂුවද අප දෙරටේ අතීත මිත්‍ර සබඳතාවය තවදුරටත් ශක්තිමත් කලේය. මෑත ඉතිහාසය ගැන

සොයා බැලීමේදී අප දෙරට අතර, රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වා වසර 54 ක් ගෙවී තිබේ. මෙම වසර 54 තුළ ශ්‍රී ලංකාව හා චීනය අතර පැවතියේ ශක්තිමත් මිත්‍ර බැඳීමකි.

1952 සිදුවූ ඓතිහාසික ශ්‍රී ලංකා චීන රබර් - සහල් හුවමාරුව මෙම මිත්‍ර සබඳතාවය ශක්තිමත් වීමේ කඩඉමක් ලෙස හැඳින්විය හැකිය. ආර්ථික හා වෙළඳ සබඳතාවයට නව පිටුවක් මෙයින් පෙරලුනි. 1950 දී අප දෙරටම වඩා හොඳ අවබෝධයකින් යුතුව රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කලේය.

දිවංගත අග්‍රාමාත්‍ය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා 1950 දී මෙම රාජ්‍යතාන්ත්‍රික සබඳතාවය තවදුරටත් නිලවශයෙන් තහවුරු කරන ලදී. ඒ අනුව 1957 දී සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාව හා චීනය ආසියානු කලාපයේ ඉතාම මිත්‍ර රටවල් දෙකක් ලෙස රාජ්‍යතාන්ත්‍රික (diplomatic) වශයෙන් බැඳුනි. දෙරටේම තනාපති කාර්යාල ආරම්භ වූයේ ඉන් අනතුරුවය. අද පෙරටත් වඩා ශ්‍රී ලංකා චීන තනාපති සබඳතා මගිනි, ආර්ථික, සමාජ, සංස්කෘතික, වානිජ, අයතනික ආදී විවිධ විෂයන් ඔස්සේ සබඳතා පවත්වාගෙන යයි.

චීනය ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ, සංස්කෘතිය වර්ධනය කිරීමට අතීතයේ සිටම උපකාර කලේය. අතීත බැඳීම් මෙන්ම දෙරටම බෞද්ධ ආගමික පසුබිමක් සහිත සංස්කෘතියන් සංයුක්ත වීම මෙයට සෘජුවම බලපා තිබේ. එසේම සමාජ හා දේශපාලනික සබඳතාවයද මෙයට ප්‍රධන වශයෙන් උපකාරි වී ඇත. මේ අනුව චීනය ශ්‍රී ලංකාවට විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ආධාර ලබා දී තිබේ.

මෙරටදී නොබැඳි ජාතීන්ගේ රාජ්‍ය නායක සමුළුව පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා දී ශ්‍රී ලංකාවේ ගෞරවය ආරක්ෂා කරදීමට චීනය නොපැකිලිව ඉදිරිපත් විය. ඒ අනුව ආසියාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨ නිර්මාණයක් වූ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (BMICH) ඉදිකර ශ්‍රී ලංකාවට භාරදුන්නේය. නොබැඳි ජාතීන්ගේ සමුළුව ගෞරවාන්විතව එහිදී පැවැත්වීමට හැකිවිය. උපරිමාධිකරණ සංකීර්ණය, රිජ්වේ ආර්යා ළමා රෝහල, ගිංගඟ ව්‍යාපාරය චීනයෙන් අතීතයෙදී මෙරටට මිත්‍රත්වය වෙනුවෙන් ලැබුනු පරිත්‍යාගයන්ය.

වර්තමානයේදී අප දෙරට අතර මිත්‍රත්වය තවත් ශක්තිමත් වී තිබේ. ඒ අන්කිසිවක් නිසා නොව අතීතයේ පරම මිත්‍රත්වය චීනය අමතක කර නොමැත නිසාවෙනි. එයට තුඩුපඩුරු ලෙස අපට කිසිදු රටකින් ලබාගත නොහැකි ව්‍යාපෘති රැසක් චීනයෙන් ලබා දී තිබේ. මෙරට දැවැන්ත අර්බුදයක්ව පවතින විදුලි බල ප්‍රශ්නයට දිගුකාලීන ස්ථිර විසඳුමක් ලෙස නොරොච්චෝලේ තාප බලාගාරය ඉදිකිරීමට උපකාර කිරීම ඒ අතර ප්‍රධාන වේ. අදියර තුනක් යටතේ ක්‍රියාත්මක නොරොච්චෝලේ තාප බලාගාරය නිමවීමෙන් මෙරට විදුලිබල ගැටළුවට සාර්ථක විසඳුමක් ලැබේ. හම්බන්තොට වරාය ඉදිකිරීමද චීනයෙන් ලද තවත් අගනා සම්පතකි. ශ්‍රී ලංකාවට ආසන්න නැව් මාර්ගයේ ගමන්කරන නැව් සඳහා ඉන්ධන අතුළු අනෙකුත් පහසුකම් සපයා දීමත්, සංචාරක කර්මාන්තයටත්, වෙළඳ හුවමාරුවටත්, හම්බන්තොට වරාය වටිනා සම්පතකි. ඉතාම අඩුපොලී ණය සහන යටතේ චීනයේ නවීන තාක්ෂණය යොදා මෙම වරාය ඉදිකරයි. චීනයේ පුහුනු ශ්‍රමිකයින් මෙහි සේවය කරන අතර එමගින් ඉදිකිරීම් නියමිත ප්‍රමිතියට අනුව සිදුකිරීමට

හම්බන්තොට ඉදිකරන මෙරට දෙවන ජාත්‍යන්තර වරාය

අවස්ථාව සැලසේ. හම්බන්තොට වරාය ඉදිකිරීම චීන සමාගමක් මගින් සිදුකිරීම නිසා ආර්ථික මෙන්ම විද්‍යාත්මක වශයෙන්ද වාසි රැසක් ශ්‍රී ලංකාවට ලැබේ. දේශීය ඉන්ජිනේරුවන්ද මෙහි සේවය කිරීම නිසා අප රටට ගැලපෙන ලෙස වරායේ ඉදිකිරීම් සිදුකෙරේ. සෘජු හා වක්‍ර රැකියා 60,000 වඩා මෙයින් ශ්‍රී ලාංකිකයින්ට උදාවේ. මෙයට අමතරව දකුණු පළාතට හා ආසන්න දිස්ත්‍රික්කවලට විශාල දියුණුවක්ද වරාය ඉදිකිරීම මගින් ලැබේ.

කොළඹ නෙළුම්ඩිස් පිටියේ ඉදිවන දකුණු ආසියාවේ විශාලතම ප්‍රසාංගික කලා මධ්‍යස්ථානයද චීනයෙන් ශ්‍රී ලංකාවට හිමිවූ තවත් වටිනා සංස්කෘතික පරිත්‍යාගයකි. මෙතෙක් ශ්‍රී ලාංකික කලාකරුවන්ට අහිමිව තිබූ සියළුම පහසුකම් සහිත කලා මධ්‍යස්ථානය මෙමගින් හිමිවේ. චීනයේ නවීන ඉන්ජිනේරු තාක්ෂණය යොදා මෙය ඉදිකරයි. මේ සඳහා වෙනත් රටකින් ඉන්ජිනේරු තාක්ෂණය යොදා ගත්තේ නම් ඒ සඳහා අතිවිශාල මුදලක් ගෙවීමට සිදුවේ. එහෙත් සියළු ඉදිකිරීම් චීනය සිදුකරන නිසා අඩු වියදමකින් උසස් කලාගාරයක් අපට ලැබේ.

ඉතාමත් මෑතදී චීනය අපට ලබාදුන් තවත් විශිෂ්ඨ උපකාරයක් වන්නේ, මත්තල ඉදිකරන මෙරට දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපලයි. කොළඹට සීමා වී තිබූ ජාත්‍යන්තර ගුවන්තොටුපල හම්බන්තොට වැනි ඈත දුෂ්කර ප්‍රදේශයකට ලබාදුන්නේද චීනයයි. මෙම ගුවන්තොටුපල මෙරට ආර්ථිකය වේගයෙන් ඉහළ නංවන වැදගත් සාධකයකි.

මෙරටට සුනාමි ව්‍යසනය පැමිණි මොහොතේදී පළමුවෙන් සහය ලබාදුන්නේද චීනයයි. සුනාමි දිවයිනට පැමිණි මොහොතේ එම දිනවල ශ්‍රී

මත්තල ඉදිකරන මෙරට දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපල

ලංකාවේ සංචාරය කළ විදේශ රටවල් සඳහා වන චීන මිත්‍ර සංගමය සභාපති චෙන් හවුසු මහතා (Chen Hausu) වහා ක්ෂනිකව මැදිහත්ව මූල්‍ය ආධාර ලබාදුන්නේය. ඉන් අනතුරුව චීන රජය ද්‍රව්‍යමය හා මූල්‍ය ආධාර විශාල වශයෙන් ලබාදුන්නේය. බේරුවල වරාය වැනි සුනාමියෙන් විනාශ වූ වරායන් නැවත ප්‍රතිසංස්කරණයට ආධාර ලබාදුන්නේය. සුනාමි ගම්මානද ඉදිකළේය.

දසක තුනක යුද්ධය අවසන් කිරීමේ තීරණාත්මක අවධියේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් පෙනී සිටි මිත්‍ර රටවල් තර චීනය ඉදිරියෙන්ම සිටියේය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට ශ්‍රී ලංකාවට එරෙහිව යෝජනාවක් ඇතුළුකල අවධියේදී චීනය සිය නිශේධ බලය යොදා එය න්‍යාය පත්‍රයට ගැනීම පවා වැලකුවේය.

එහෙත් ශ්‍රී ලංකා චීන මිත්‍ර සම්බන්ධතාවයට ක්‍රි.ව. 412 තරම් ඈතට දිවයන්නකි. ක්‍රි.ව. 412 දී ශ්‍රී ලංකාවට පැමිණි ලෝක ප්‍රසිද්ධ දේශගවේෂක භික්ෂුවක වූ පාහියන් හිමියන් මෙහි ආරම්භයලෙස සැලකීමට ඓතිහාසික සාධක තිබේ. (මේ පිළිබඳව දීර්ඝ විස්තරයක් පාහියන්ගල ලිපියෙන් විස්තර කෙරේ.)

ශ්‍රී ලංකාව හා චීනය අතර මිත්‍රත්වය වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා හා චීන රාජ්‍ය සභාපති හූ ජින්තාඕ මහතා වර්ථමානයේදී කැපවී කටයුතු කිරීම දෙරටටම වැදගත්වී තිබේ. අප රටකෙරෙහි චීනය දක්වන හිතෛෂිභාවයත්, මිත්‍රශීලිත්වයත් අන් කවර කාරණයටත් වඩා වැදගත්ය.

මෙම තත්වයට පත්කරන්නට වර්තමාන මෙන්ම අතීතයේ දෙරටේ නායකයන් කල කැපවීම සමස්ථ ජාතියම අගය කරති.

(දෙරටේ මිත්‍රත්වය වර්ධනය කිරීම සඳහා මෙරට මිත්‍ර සංගම් ඉටුකරන මෙහෙවර පිළිබඳව විස්තර මීලග කලාපයෙන් බලාපොරොත්තුවන්න.)

- සඳුන් තාරක -

මිතුරුසර
友谊桥

2011 අප්‍රේල් / මැයි

CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය
අංක 16, ස්කෙල්ටන් ගාර්ඩන්ස්, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දුරකතන / ෆැක්ස් : +94 11 2589747
ඊ-මේල් : mithurusaracri@gmail.com

උපදේශක මණ්ඩලය — ඉන්ද්‍රනන්ද අබේසේකර, ජේ.ජී. අමරජීව, කුල ශ්‍රී කාරියවසම්, නන්දසේන මැදවන්ආරච්චි

顾问 — 英德拉南德 阿贝赛格, J.G.阿马拉吉瓦, 库里西里 卡里亚瓦桑, 南德西那 马德旺阿拉吉

විධායක සංස්කාරක - වං සියාඕතුං
执行主编 王晓东

ප්‍රධාන සංස්කාරක - මධුශාන් කුලරත්න
主编 马杜尚 库勒拉特纳

සහය සංස්කාරක - සුං ජියා ජියා, ෂෙං ලී, තිලක් උඩුමුල්ලගේ, සමන්ත දහනායක
编辑 - 孙佳佳, 盛莉, 迪拉克 马杜穆拉格, 萨曼德 达哈那亚克

පිටු සැකසුම — ගිහාන් මධුසංඛ
排版 — 吉涵 马杜尚卡

ප්‍රකාශනය — ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් පංතිය
出版机构 — 中国国际广播电台斯里兰卡兰比尼广播孔子课堂

මුද්‍රණය — අමල් ප්‍රින්ටර්ස්
印刷 — 阿玛尔 普林达尔斯

කතුවැකිය..........

අපි චීන බස ඉගෙන ගනිමු

ලොකයේ සංස්කෘතීන් වෙනස්විම වලට භාජනය වෙමින් තිබේ. එලෙස සංස්කෘතීන් වෙනස්වීම නිසා ජනතාවගේ එදිනෙදා කටයුතුද වෙනසකට ලක් වී ඇත. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් මධ්‍ය සංවර්ධන රාජ්‍ය බවට පත්වී ඇති අතර ඇතැම් රාජ්‍යයන් සංවර්ධනයේ පහලට කඩා වැටෙමින් සිටී. එමෙන්ම ලොව ඇතැම් රාජ්‍යයන් නොසිතන මොහොතක ප්‍රබල රාජ්‍යයන්ට අභියෝග කර ආර්ථික, සමාජ, සංස්කෘතික, අධ්‍යාපන, විද්‍යා අංශයන් වේගයෙන් ඉහලට ගමන් කරමින් සිටී. එවන් අවස්ථාවක ලොව ප්‍රචලිත යයි සිතූ භාෂාවන් වෙනුවට වෙනත් භාෂාවන් වේගයෙන් මහද්වීප හරහා ප්‍රචලිත වෙමින් පවතී.

අප චීන බස හා සංස්කෘතික ඉගෙන ගත යුත්තේ අනාගත ඉලක්ක හොඳින් අවබෝධ කරගෙනය. ප්‍රමාද වීම පසුතැවීමට හේතුවක් වීමට ඉඩනොදී, ඒ සඳහා අවස්ථාව ලබාගතයුතුය. අප සිටින ස්ථානය නව වසර කිහිපයකින් සිතාගැනීමට බැරි ලෙස ප්‍රබල වෙනසකට ලක්විය හැක. එබැවින් ලෝකයේ වැඩිම පිරිසක් භාවිතා කරන, චීන භාෂාව ඉගෙන ගැනීම නිසා තවත් වසර කිහිපයකින් ඔබ සතුටට පත්විය හැකි කාරණයක් වන බව නොකියාම බැරිය.

මධුශාන් කුලරත්න
ප්‍රධාන සංස්කාරක

පිටකවරය - චීනයේ UIBE සංස්කෘතික කණ්ඩායමේ නර්තනයක්.

ඓතිහාසික චීන ශ්‍රී ලංකා මිත්‍රත්වයේ සලකුණ

පාහියන්ගල

කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල මැතිවරණ කොට්ඨාසයේ බුලත්සිංහල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පාහියන්ගල පිහිටා ඇත. කොළඹ සිට හොරණ මාර්ගයේද, කළුතර සිට මතුගම මාර්ගයේද, බුලත්සිංලට ගමන්කළ හැකිය. බුලත්සිංහල සිට සැතපුම් තුනක් පමණ නැගෙනහිරට වන්නට පාහියන් ලෙන පිහිටා ඇත. කොළඹ සිට හොරණ මාර්ගයේ සැතපුම් 37 ක් පමණ දුරක් ගිය පසු බුලත්සිංහලට ළඟ විය හැකිය. නිරිත දිග කලාපයේ මීටර් 30 - 150 අතර උස ප්‍රදේශයේ පාහියංගල පිහිටා ඇත. අඩි 600 ක් පමණ උස කඳු වැටියේ බටහිර දිසාවට මුහුණලා ලෙන පිහිටා ඇත. සිංහරාජ වනාන්තරය ඉතා ආසන්නව පිහිටා ඇත. වාර්ෂික වර්ෂාපතනය මිලි.මී. 400 කට ආසන්න වන අතර උෂ්ණත්වය 25.0 - 27.5 ක් පමණ වේ. මෙම පරිසර සාධක අනුව සදාහරිත තෙත් කලාපීය වනගහනයක් දක්නට ඇත. මීමන තෘණ වගාවේ සිට ගිනිහොට තෙබු පන්තරා, වැනි ශාක වර්ග බහුලව ඇත. වනාන්තරයේ ජීවත්වූ මිනිසාට මේ සෑම දෙයක්ම ආහාරයකි.

තෘණ වර්ගය මත ළඳු කැලෑ සහ එය මත යටිරෝපන උපවියන් ස්ථරය ද, උඩු වියන් ස්ථරය ද නිර්මාණය වී ඇත. මෙම පරිසර තත්වය නිරත දිග තෙත් ප්‍රදේශයේ ජනාවාස බිහිවීමට බලපෑවේය.

ළඳු කැලෑ වල, හිඹොටු, දං, මහබෝවිටිය, හීංබෝවිටිය, ගඳපාන, හිරිතල, කටුවල වැනි අලවර්ග සරුවට වැඩී ඇත. උඩු වියන් ස්ථරය තුළ ආහාරයට ගත හැකි විවිධ පළතුරු වර්ග දක්නට ඇත. කීන ඇටඹ, කැලෑදෙල් ඉතා හොඳ ආහාර වර්ග වේ. මෙහි වාසය කළ ජනයා ප්‍රධාන ආහාරයක් වශයෙන් කකුණ හා කැලෑ දෙල් භාවිතා කළ බවට සාධක ඇත පලල් කොළ විශාල අතුපතර සහිත අඩි 50කට වඩා උස තෙත්කලාපීය වනාන්තරයෙන් භූමිය ආවරණය වී ඇත. එබැවින්, භූමිය වසාපැතිර තිබෙන මූල පද්ධතිය පාංශු ඛාදනය වලකාලයි. පරිසර සාධක මත විවිධ හතු වර්ග වැවේ. කඳහතු, කම්බොක්ක හතු, වැලි හතු, ඉඳලොලු ආදිය ආහාරයට ගන්නා හතු වර්ග වේ. මේ අනුව පරිසරය ආහාර ගබඩාවකි.

පාහියන් නම ව්‍යවහාර වූයේ ඇයි

මෙම ස්වයංපෝෂිත පරිසර පද්ධතිය තුළ වාසය කළ මිනිසාගේ වගතුග සෙවීමට පෙර "පාහියංගල" යන නම ව්‍යවහාර වීමට හේතුව සොයා බැලීම වැදගත් වේ. චීනයේ සිට ක්‍රි.ව. 412 දී ලංකාවට පැමිණි චීන උත්තරීතර "පාහියන්" නම් වූ භික්ෂූන් වහන්සේ සිහිපත්වීම සඳහා උන්වහන්සේගේ නම මේ ප්‍රදේශයටත්, ගල්ලෙනටත් භාවිතා කර ඇත. උන්වහන්සේ කවුද යන්න අප විසින් හඳුනාගත යුතුය. ගවේෂණ ක්‍රියා වලියේ දී මෙතරම් වැදගත්වූ තෙර නමක් ලෝක ඉතිහාසය තුළ ජීවත් වී නැත. එය ලංකාවට සම්බන්ධවීම අතිශයින්ම වැදගත් වූ නිසා ආදි කාලයේ සිටම මෙම ප්‍රදේශයට "පාහියන්" නම භාවිතා කළේ කළගුණ සිහිකිරීමක් නිසා විය යුතුය. "පාහියන්" කවුද යන්න ක්‍රි.ව. 519 දී චීන ජාතික ආචාර්ය "ලාග්" තුමා විසින් ලියන ලද "සුප්‍රසිද්ධ භික්ෂූන් වහන්සේලා ගැන සිහිවීම්" කෘතියේ ලියා ඇත. ඒ අනුව "ගාන්හ්හි" ප්‍රදේශයේ "පිංයෑං" පළාතේ "යැං" නම් ගමේ ඉපදී ඇත. "කුං" පෙළපතට අයත්වේ. අවුරුදු 65 වයසේදී බුද්ධ ධර්මය සොයා දේශ ගවේෂණය අරඹා ඇත. ක්‍රි.ව. 412 දී ලංකාවට පැමිණ ඇත. ගවේෂණ කාලය අවුරුදු 15 කි. අපවත්වන විට වයස අවුරුදු 87 කි. මෙම තොරතුරු පාහියන් වාර්තාව අනුව පිළියෙළ කළ ප්‍රංශ පිටපතේ ද සඳහන්වේ. ආපසු යන ගමනේ දී ජවා දූපත් හරහා චීනයේ වාංක්වා පළාතට ගොස් ඇත. මෙම තොරතුරු විමසන විට උපන් වර්ෂය ක්‍රි.ව. 332 හරහා චීනයේ වාංක්වා පළාතට ගොස් ඇත. මෙම තොරතුරු විමසන විට උපන් වර්ෂය ක්‍රි.ව. 332 හැටියට සැලකිය හැකිය. ගමනාරම්භයේ දී සිටි පිරිස ද අහිමි වී ඉතා දුකසේ දැඩි ආත්ම ශක්තියකින්

ගමනේ යෙදී ඇත.

චීනයේ චංගාන් නගරයෙන් ගමනාරම්භ කර මධ්‍ය ආසියාව ඔස්සේ වයඹ දිග ඉන්දියාවේ බෝලාන් කයිබර් දුර්ග අතරින් ඉන්දියාවට අවතීරණය වී ඇත. එහි වර්ෂ 6 ක් ගත කර ක්‍රි.ව. 412 ඉන්දියාවෙන් පිටත්වී ලංකාවට පැමිණ ඇත. එවකට ලංකාවේ රජකම් කර ඇත්තේ 1 උපතිස්ස රජුගේ මලනු මහනාම රජ තුමාය. "පාහියන් හිමි" තරම් දීර්ඝ විස්තරයක් විදේශිය වෙනත් කිසිවකු ලංකාව ගැන ලියා නැත. මෙම කාලයේදී ලංකාව හා චීනය සමග ඉතා යහපත් මිතුරු සම්බන්ධතා පවත්වා ඇත. චීනය රාජසභාව සමග දූත මෙහෙවර 4 ක් පැවැත්වූ බවට සාධක ඇත. ක්‍රි.ව. 426 දී ලංකා භික්ෂුනීන් 08 නමක් රාජසභාවට යාම ක්‍රි.ව. 429 දී භික්ෂූන් 03 නමක් චීනයේ නැන්කිං නගරයට යාම. ක්‍රි.ව. 434 දී ප්‍රථම වරට චීන කාන්තාවක් පැවිදිවීම ක්‍රි.ව. 456 දී මූර්ති ශිල්පියෙකු වූ භික්ෂුවක් සමග භික්ෂූන් 05 නමක් චීන අධිරාජයා බැහැදැකීම නිදසුන් වේ. දූත ගමන් හතරක්ම කෙටි කාලයකදී සිදුවීමෙන් පෙනී යන්නේ "පාහියන්" ගමනේ ප්‍රතිඵල ඊට හේතු වන්නට ඇති බවය. ලංකාව ජනාවාස වීමේ සිට මධ්‍ය කාලීන යුගය දක්වා ආගමික සංස්කෘතික හා දේශපාලන තොරතුරු උන්වහන්සේ ලියා ඇත. උන්වහන්සේ ලංකාවට ගොඩබට ස්ථානය හරිහැටි හඳුනාගෙන නැත. කෙසේ නමුත් නිරිත දිග ප්‍රදේශයෙන් ගොඩබසින්නට ඇතැයි සිතිය හැකිය. බුලත්සිංහල ගල්ලෙන නවාතැන් සඳහා තෝරා ගත්තේ ගොඩබට ප්‍රදේශයට ඉතා ආසන්නව තිබුණු නිසා විය හැකිය. සිරිපාදයට යන අතර මග නවාතැන් පල හැටියට "පාහියන් ලෙන" සොයා ගෙන ඇත. ක්‍රි.ව. 1405 - 1409 1411 යන වර්ෂවල චීන "යුං.ලෝ. අධිරාජයාගේ කාලයේ ලංකාවට භටහමුදා පැමිණ ඇත. රයිගම රජ කළ වීර අලකේශ්වර රජු ක්‍රි.ව. 1411 දී සිරකරුවකු ලෙස චීනයට අල්ලා ගෙන ගියහ. රයිගමත් බුලත්සිංහලත් ඉතා ආසන්නව පිහිටා ඇත. "පාහියන් හිමි" නවාතැන්ගත් නිසාම එම ගල්ලෙන "පාහියන් ලෙන" හැටියටද ගම "පාහියන් ගල" නමින් එදා සිට ව්‍යවහාර කරන්නටද මෙහි විසූ ජනතාව පෙළඹී ඇත.

ක්‍රි.ව. 412 දී "පාහියන් හිමි" නවාතැන් ගැනීමට හේතුව එම කාලය වන විට ඒ අවට ජනාවාස තිබුන නිසා විය යුතුය. එපමනක් නොව ගිහි හෝ පැවිදි ජනතාවක් මෙම ලෙන තුළ වාසය කරන්නට ඇත.

ජනාවාස බිහිවීම

ජනාවාස පිළිබඳව ස්ථිරවම කාලය කිව නොහැක. මීට වසර 31000 කට පෙර පාහියන් ගල ප්‍රදේශයේ පාහියන් ලෙන තුළ මානව ජනාවාස පැවති බවට සථිර සාක්ෂි ලැබී ඇත. මෙම මානව ජනාවාස කාලය "මධ්‍ය ශිලා" යුගය වශයෙන් හඳුන්වයි. මධ්‍ය ශිලා යුගය පිළිබඳව ඉතා ක්‍රමානුකූලව තොරතුරු ලංකාවේ ස්ථාන රාශියකින් ලැබී ඇත. පාහියන් ලෙනෙන් හමුවී ඇති හිස් කබල වර්ෂ 31000 පෙර දීද, කුරුවිට බටදොඹ ලෙනෙන් හමුවී ඇති හිස් කබල වර්ෂ 28000 කට පෙර ද, කිතල්ගල බෙලි ලෙනෙන් අවුරුදු 27000 සිට අවුරුදු 34000 දහස දක්වා ද මානව අවශේෂ ලැබී ඇත. මෙම ගල්ලෙන් වලින් ක්ෂුද්‍රගල් මෙවලම් ද සත්ව හා ශාක ආහාර කොටස් ද හමුවී ඇත. මේවා අඩ සඳ ත්‍රිපිසියම වැනි ජ්‍යාමිතික හැඩතල දරයි. ක්ෂුද්‍ර ගල් මෙවලම් වල ස්භාවය අනුව ශිලා යුගවල කාලය නිර්ණය කරයි. ඒ අනුව යුරෝපා රටවල් වල මධ්‍ය ශිලා යුගයේ කාලය වර්ෂ 12000 ක් පමණ වේ. නමුත් ලංකාවේ හමුවී ඇති ක්ෂුද්‍ර ශිලා මෙවලම්වල කාලය අවුරුදු 34000 දහසකට වඩා පැරණිය. මේ හා සමාන තොරතුරු අප්‍රිකාවේ සයරේ රාජ්‍යයෙන්ද ලැබී ඇත. මේ අනුව මානව පරිණාමයේ වඩාත්ම දියුණු මානව ප්‍රභවයක් ආසියාවේ ලංකාවෙන් හමුවී ඇත.

ආසියාවේ මෙතෙක් හමුවී ඇති වඩාත් පැරණිම මානව සමාජයක තොරතරු පාහියං ගලින් හමුවී ඇත. දැනට ලැබී ඇති කාල නිර්ණය අනුව වසර 31000 කට වඩා පැරණි හිස් කබලක් හමුවී ඇත. ක්‍රි.ව. 412 දී චීන ජාතික "පාහියන්" භික්ෂූන් වහන්සේ සිහිකිරීම සඳහා එතැන සිට පාහියන් ලෙන වශයෙන් නම් කර ඇත.

"පාහියන් ලෙන" ලංකාවේ ආදිතම ජනාවාස පැවති විශාලතම ගල්ලෙන වන්නේය. පුරාවිද්‍යා කැණිම් වලින් හමුවී ඇති හිස් කබල වසර 31000 කට වඩා පැරණි බව කාබන් 14 පර්යේෂණ ක්‍රමය අනුව තීරණය කර ඇත. මෙය දැනට ආසියාවේ ලැබී ඇති පැරණිම මානව හිස්කබල වන්නේය. බටදොඹ ලෙනින් හමුවූ හකු ඇටයද මෙයට ආසන්න කාලයකට අයත්වේ.

බටදොඹ ලෙන, බෙලිලෙන, බෙල්ලන් බැඳි පැලැස්ස සමාන මානව ලක්ෂණ වලින් යුතු වන්නේය. මෙම මානවයා බලංගොඩ මානවයා වශයෙන් හඳුන්වයි.

පාහියංගල හිස් කබල මානව පරිණාමය පමණක් නොව මානවයාගේ සංස්කෘතික පරිණාමය පිළිබඳවද පැරණිතම තොරතුරු හෙළි කරයි.

රතු ගුරුගල් අඹරා හිස් කබලේ රක්ත වර්ණය ආලේප කරන්නට ඇත්තේ මියගිය තම ඥාති වර්ගයා වෙනුවෙන් කිසියම් භක්ති ප්‍රණාමයක් හෝ ප්‍රජනීයත්වයක් හෝ දැක්වීම සඳහා වන්නට ඇත. ආසියාවේ ආදිතම මානවයාගේ අභිචාරවිධි අනාවරණය කර ගැනීමට මෙම සාධකය උපයෝගී වී ඇත. සායම් නිපදවීම හා භාවිත කිරීම පිළිබඳව දියුණු මනසක් අවුරුදු 31000 කට පෙර ලාංකිකයා සතුව පැවති බවට මෙම සාධකය සාක්ෂි දරයි. රාවණා ඇල්ල ගුහාවෙන්ද අභිචාරවිධි පැවැත්වූ හිස් කබලක් හමුවී ඇත . හිස් කබල දෙකට බෙදා හිල් විද ගොරෝසු හා නෙරා ගිය තැන් ගලෙහි උලා ඔපවත් කර ඇත. එක් පැත්තක් රතුපාට ගුරු ගලින් පාටකර ඇත. අවමංගල අභිචාරවිධි වලට තවත් සාධක විවිධ තැන් වලින් හමුවී ඇත.

"පාහියංගල" කැණීමෙන් භාවිතා කළ ශිලා මෙවලම් හමුවී ඇත. ක්ෂුද්‍ර ගල් ආයුධ ගණයට වැටෙන මේවා හමුවී කාලය මධ්‍යගත ශිලා යුගය ලෙස නම් කරයි. එම යුගයේදී සුළු අවි භාවිතා කර කුඩා සතුන් මරා ආහාරයට ගෙන ඇත. හමුවී ඇති කුඩා සත්ව අවයව, කුරුල්ලන්, මීමින්නන්, ඉත්තෑවන් වැනි සතුන්ගේය. එක්කෝ ලොකු සතුන් දඩයම් කිරීම අපහසුවන්නට ඇත. නැතහොත් අවශ්‍ය ප්‍රමාණයට කුඩා සතුන් බහුල වන්නට ඇත. පරිසරයේ පැවති ආහාර සම්භාරය නිසා පහසුවෙන් සපයාගත හැකි ආහාර වලට වැඩි අවධානය යොමුවන්නට ඇත. බැදි දෙල් කැකුණ ආහාරයට ගත් බවට සාක්ෂි ඇත. අවට වනාන්තරයේ ඒවා ලබා ගැනීම ඉතා පහසුය.

මධ්‍ය ශිලා යුගයේ ආරම්භක අවධියට අයත් මානව ජනාවාසය පාහියංගල බව කිව යුතුය. පසු කාලයේ දී ගල්ලෙන තුළද එයින් පහල ප්‍රදේශයේද ආගමික ස්ථාන ගොඩනගා ඇත. ලෙන තුළ තිබෙන විහාරස්ථානය නුවර යුගයේ ලක්ෂණ වලින් සමන්විත වේ.

ජේ.පී. යසපාල

ජාතීන් 56 ක් එකම රටක ....

චීනයේ ජන වර්ගවලට ඉතා දිගු ඉතිහාසයක් තිබෙන අතර චීනයේ ජීවත්වන සුළු ජාතිකයන්ටද එවන් දිගු ඉතිහාසයක් තිබේ. සුළු ජාතිකයන් විශාල පිරිසක් ජීවත්වන ලෝකයේ රටවල් අතර චීනය ඉදිරියෙන් සිටී. ඔවුන් විවිධ සංස්කෘතික විවිධ ජෛව විවධත්වයක් තුළ ජීවත්වෙති. වර්තමානයේදී චීනයේ විවිධ ජාතීන් 56 ක් ජීවත්වන අතර ප්‍රධාන ජාතිය හන් (Han) ජාතියයි. සමස්ථ චීන ජනගහනයෙන් සුළු ජාතිකයන් ප්‍රමාණය සියයට 8.41 පමණ වන බව සුළු ජාතිකයන් පිළිබඳව "Ethnic Minorities of China" නම් ග්‍රන්තය රචනා කළ Xu Ying හා Wang Boagin සඳහන් කරයි. සුළු ජාතිකයින් රටේ විවිධ ස්ථානවල ජීවත්වෙති. ඔවුන්ටම ආවේනික සංස්කෘතික හා සමාජ චර්යාවක් තිබේ.



මෙම සියළුම සුළු ජාතිකයන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කරමින් චීන රජය සමානව ඔවුන්ට පහසුකම් සපයයි. එය සුළු ජාතීන්ගේ අනාගත ආරක්‍ෂාවට ඉතා වැදගත් බව මානව විද්‍යාඥයින් පෙන්වයි.

මොන්ගොලියන් ජාතිකයන් අශ්වයන් සමඟ මිතුදම Mongolian

ස්ථිර වාසස්ථානයක් නොමැති ගෝත්‍රික ජනකොටසක් ලෙස මොන්ගොලියන්වරුන් සැලකේ. ඔවුන් චීනයේ උතුරු දිග තණ බිම ආශ්‍රිතව ජීවත්වෙති. වර්ථමානයේදී මොන්ගොලියන්වරු චීනයේ ස්වයංපාලිත ප්‍රදේශයක් වන ඇතුළු මොන්ගොලියාව සංවර්ධනයද කර තිබේ.

මොන්ගොලියාව නැගෙනහිර චීනයේ Changdi කඳු හා උස් සානු අතර හා Heilogjiang කඳු අතර පිහිටා තිබේ. බටහිරින් චියන්ශාන් කඳු හා Tarim Basin ද පිහිටා තිබේ. උතුරින් සයිබීරියානු තණබිම් හා දකුණින් යින්ශාන් කඳු පංතිය පිහිටා තිබේ. භූගෝල විද්‍යානුකූලව මොන්ගොලියානු උස්බිම් වියලි තණ බිම් සහිත ප්‍රදේශ ලෙස සැලකේ. කෙසේ වෙතත් චීනයේ උතුරු ප්‍රදේශ සිසිල්, වියලි, හිම වලින් යුක්ත ප්‍රදේශ වේ. උස්බිම් කෘෂිකර්මාන්තය සඳහා එතරම් යෝග්‍යනොවේ. පශු පාලනය සඳහා එම තණබිම් යොදා ගැනේ. සත්ව පාලනය සඳහා මොන්ගොලියානු ජනතාවට දිගු ඉතිහාසයක් තිබේ.

නැඩම් (Nadam) යනු මොන්ගොලියාවේ විනෝද ජනක ක්‍රීඩාවකි. ජූලි හෝ අගෝස්තු මාසවල නැඩම් ක්‍රිඩා උත්සවය ආරම්භවේ. තණබිම් මත මොන්ගොලියානු වැසියන් රෙස්ලින් (wrestling) හා අශ්ව රේස් සංදර්ශණ පවත්වති. මෙම සංදර්ශණ පවත්වන දිනවල විවිධ වෙළඳ ව්‍යාපාරද තාවකාලිකව ආරම්භ කෙරේ. මොන්ගොලියන් ජාතිකයින් එම වෙළඳ සැල්වල පිරී ඉතිරී සිටිති.

රෙස්ලින් ක්‍රීඩාවට බොහෝ මොන්ගොලියන්වරු ආශාකරති. 13වන සියවසේදී මොන්ගොලියන්වරුන්ට නායකත්වය දුන් Genghis Khan විසින් මොන්ගොලියානු යුධ හමුදාවට රෙස්ලින් ක්‍රීඩාව මුලින්ම හඳුන්වා දී තිබේ. මේ නිසා ක්‍රමයෙන් මොන්ගොලියන් වැසියන් අතර රෙස්ලින් ක්‍රීඩාව ජනප්‍රිය විය. බර පිළිබඳව උනන්දුවක් නොදක්වන රෙස්ලින් ක්‍රීඩකයින් තමන්ගේ වැලමිට තබා අනෙකාගේ ශරීරය තණබිම මත පතිත කිරීමට උත්සහ කරති. එය සාර්ථක වුවහොත් ඔහු ජයග්‍රාහකයා බවට පත්වේ. රෙස්ලින් ක්‍රීඩාවට ආවේණික ඇඳුමක් තිබේ. චීනයේ සාම්ප්‍රදායක සිතුවම් හා වර්ණ වලින් මෙම ඇඳුම හැඩගැන්වේ. රෙස්ලින් ක්‍රීඩාවේ දක්‍ෂයින්ට වර්ණ පදක්කම් තුනක් ලබාදෙති. එනම් සිංහයා, අලියා සහ උකුස්සායි.

අශ්ව තරගද මොන්ගොලියන්වරු අතර ජනප්‍රිය ක්‍රීඩාවකි. තරුණ මොන්ගොලියන්වරු අශ්ව ක්‍රීඩාවට යොමුවෙති. අශ්වයින් මත සිට සටන්කිරීම, දඩයම් කිරීම හා දිවීම ඔවුන් මෙහිදී ප්‍රගුණ කරති.

ලබන කලාපයට.........

- චමින්ද්‍ර කුමාරි -

පසුගිය කලාපයෙන්

චීන භාෂා උප භාෂා

ලෝකයේ ජනගහනයෙන් වැඩි පිරිසක් භාවිතා කරන ලිඛිත භාෂාවක් ලෙස ඉපැරණි හා පරිනත චීන භාෂාව ඉගෙන ගනිමු.......

චීන භාෂාවේ ආරම්භය පිළිබඳ ඉතිහාසය ඉතා දීර්ඝය, විවිධ සොයා ගැනීම් වලට අනුව අලුත් තොරතුරු ආවරණය වීමට ද ඉඩ ඇත. වත්මන් චීන භාෂාව මීට වසර තුන්දහසක (3000) ට පෙර ආරම්භ වූ බැව් පිළිගැනීමයි. ලෝකයේ ලිඛිත භාෂාවක් ලෙස සංවර්ධනයවූ ඉතා පරිණාත එමෙන්ම දීර්ඝතම ඉතිහාසයක් ඇති භාෂාව ලෙස චීන භාෂාව පිළිගැනේ.

චීන බස භාවිතා කරන්න් බිලියන 1.2 අධික ප්‍රමාණයක් සිටින අතර මෙය ලොව වැඩිම පිරිසක් භාවිතා කරන භාෂාව ලෙසද හැඳින්විය හැක. චීනයට අමතරව සිංගප්පූරුවේ හා මැලේසියාවේ වෙසෙන බොහෝ මිනිසුන් ද චීන බස භාවිතා කරයි. ඊට අමතරව එතෙර වෙසෙන චීන ජනතාව සහ ලොව පුරා විසිරී සිටින චීන සම්භවයක් සහිත විදේශිකයන් ද, චීන භාෂාවේ උප භාෂා ඔවුන්ගේ දේශීය භාෂාව ලෙස භාවිතා කරයි.

චීන ජාතිකයින් භාවිතා කරන ප්‍රධාන භාෂාව චීන භාෂාව වන අතර මෙය එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී භාෂාවක් අතරින්ද එකකි. චීන ජාතිකයින්ගේ සම්මත භාෂාව Putoghua (උසස් චීන බස) වේ. මෙය තායිවාන් ප්‍රාන්තයේ guoyu (ජාතික භාෂාව) ලෙස හඳුන්වයි. එමෙන්ම සිංගප්පූරුවේ හා මැලේසියාවේ huayu (චීන භාෂාව) ලෙස හඳුන්වයි. උසස් චීන භාෂාවේ සම්මත උච්චාරණ විධි බීජිං උච්චාරණ විධි වන අතර එහි මූලික උප භාෂාව උතුරු උප භාෂාවයි. එමෙන්ම එහි සම්මත ව්‍යාකරණානුකූල නීති ප්‍රකෘති නූතන චීන ස්වභාෂාව අනුව වේ. උසස් චීන භාෂාව විවිධ පළාත් වල වෙසෙන චීන ජාතිකයන් අතර හා විවිධ ජනවර්ග (චීනයේ) අතර සන්නිවේදනය පහසු කරවයි.

අතිවිශාල භූමි ප්‍රදේශයක් සහ විශාල ජනගහනයක් චීනය සතුවේ. සියලුම ජනතාව චීන භාෂාව කතා කලත්, විවිධ පළාත් වල ඔවුන් කතා කරන ආකාරය විවිධ ය. එම විවිධාකාර චීන භාෂාවේ උප භාෂා ලෙස හඳුන්වයි. උප භාෂා සාමාන්‍යයෙන් ප්‍රදේශීය භාෂා ලෙසද හැඳින්වේ. චීන භාෂාවේ ශාඛා වන මෙම උප භාෂා සමහර පළාත්වල පමණක් භාවිතා කරයි. වර්තමානයේ චීන භාෂාවට උප භාෂා 7ක් අයත් වේ. එනම් උතුරු උප භාෂාව, Wu උප භාෂාව, Gan උප භාෂාව, Hakka,Min උප භාෂාව, Yue උප භාෂාව හා Guangdong උප භාෂාව, Xiang උප භාෂාවයි. මේ අතරින් වැඩි වශයෙන් භාවිතා කරණුයේ උතුරු උප භාෂාවයි. Hakka, Fujian සහ උප භාෂාව Guangdong උප භාෂාව එතෙර වෙසෙන චීන ජාතිකයින් විසින් භාවිතා කරයි.

චීන භාෂාව් උප භාෂා බොහෝ අසීරුයි. (පැටලිලිකාරියි). සෑම උප භාෂාවක්ම, තවත් උප භාෂාවකින් තුන් ආකාරයකින් වෙනස් වේ. ඒ උච්චාරණය, වචන මාලාව සහ ව්‍යාකරණ ලෙසයි. මෙයින් බොහෝ කැපී පෙනෙන්නේ උච්චාරණයේ වෙනසයි. ගිණිකොන දිග චීනයේ වෙරළබඩ ප්‍රදේශවල මෙවැනි කියමනක් ඇත. "ලී. 10 ක් ඇතුළත ප්‍රදේශයේ උච්චාරණය වෙනස්වේ".(ලී යනු චීන මිනුම් ක්‍රමයකි 1 Li = 0.5 Km). විවිධ ප්‍රදේශවල ජීවත්වන සියලුම මිනිසුන් ප්‍රාදේශීය භාෂා භාවිතා කළහෙතේ සන්නිවේදනයේදී එය විශාල අපහසුවක් වනු ඇත.

සමාජයීය සම්බන්ධකම් වලද පොදු භාෂාවක් භාවිතා කළ බව බොහෝ කලකට පෙර චීන ජාතිකයන් අවබෝධ කරගත්හ. ලි 10 ප්‍රදේශයක වෙනස්වන උප භාෂාවලට සාපේක්ෂව උසස් චීන භාෂාව සියලු මිනිසුන්ට තේරුම් ගත හැකියි. එබැවින් චීනයේ විවිධ ජනවර්ගවලට හා විවිධ ප්‍රදේශවල ජීවත්වන ජනතාවට සංස්කෘතික හුවමාරුකර ගැනීම් වලට හා තොරතුරු සම්පේෂණයට මෙය විශාල පහසුවක් විය. චීන රජය උසස් චීන භාෂාව ප්‍රචලිත කිරීමට විශේෂ අවධානයක් යොමුකරණ අතර එය ඉගෙනීමට මිනිසුන් උනන්දු කරවයි.

නූතන හන් මිනිසුන් වැඩි වශයෙන් තම ලිඛිතභාෂාව ලෙස භාවිතා කරන්නේ ස්වදේශීය චීන භාෂාවයි.

බීජිං උප භාෂාව නිරූපණය කරන උතුරු උප භාෂාව වැඩි වශයෙන් ඊසාන දිග චීනයේ, උතුරු චීනයේ, වයඹ දිග චීනයේ, නිරිත දිග චීනයේ, සහ Yangtze හා Huaihe ගංගා ආශ්‍රිත ප්‍රදේශවල භාවිතා කරයි.

ශැංහයි උප භාෂාව නිරූපණය කරන Wu උප භාෂාව වැඩි වශයෙන් චීනයේ Jiangsu හා Zhejiang ප්‍රාන්තවල සමහර ප්‍රදේශවල භාවිතා වේ.

Changsha උප භාෂාව නිරූපණය කරන Xiang හෝ Hunan උප භාෂාව වැඩි වශයෙන් Hunan ප්‍රාන්තයේ භාවිතා වේ.

Nanchang උප භාෂාව නිරූපණය කරන Gan උප භාෂාව සාමාන්‍යයෙන් Jiangxi ප්‍රාන්තයේ සහ ගිණිකොන දිග Hubei ප්‍රාන්තයේ භාවිතා වේ.Guandong ප්‍රාන්තයේ Meixian උප භාෂාව නිරූපණය කරන Hakka ප්‍රධන වශයෙන් ඊසාන දිග Guandong ප්‍රාන්තයේ, බටහිර හා උතුරු Fujian ප්‍රාන්තයේ සහ දකුණු Jiangxi ප්‍රාන්තයේ භාවිතා වේ.

Min උප භාෂාව සාමාන්‍යයෙන් Fujian ප්‍රාන්තයේ, Guandong ප්‍රාන්තයේ, Hainan ප්‍රාන්තයේ හා තායිවානයේ භාවිතා වේ. Guangzhou උප භාෂාව නිරූපණය කරන Yue හෝ Guangdong ප්‍රාන්තයේ, නැගෙනහිර හා දකුණු Guangxi ප්‍රාන්තයේ, හොංකොං සහ Macao ප්‍රදේශවල භාවිතා වේ.

පසුගිය දශකය තුළ ශ්‍රී ලංකා - චීන මිත්‍රත්වයේ නව පරිච්ඡේදයක් ආරම්භ විය. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දූරදර්ශී රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිපත්තිය තුළ දෙරටේ මිත්‍රත්වය ඉතා සමීප හා මිත්‍රශීලී ස්වභාවයක් ගෙන ඇත. එදා බණ්ඩාරණායක යුගයේ චීන - ශ්‍රී ලංකා මිත්‍රත්වය වෙනුවෙන් තැබූ මුල්පියවර දීර්ඝ ගමනක් දෙසට අවතීර්ණ කිරීමට අතිගරු ජනාධිපතිතුමා සමත් වී ඇත.

වත්මන් ලෝකයේ තුළ චීනය ප්‍රමුඛ රාජ්‍යයකි. සියළු ක්ෂේත්‍රවල ජයග්‍රහණ ලබා ඇති චීනය ජාත්‍යන්තර තලයේ තීන්දු තීරණ ගැනීමේදී තීරණාත්මක රටක් බවට පත්වී ඇත.

ශ්‍රී ලංකාවේ අපට, විදේශ භාෂාවක් ලෙස චීන භාෂාව ඉගෙන ගැනීම ඉතාමත් ඵලදායීවේ. ජාතික වශයෙන් ද ජාත්‍යන්තර වශයෙන් ද, අධ්‍යාපන උසස් අධ්‍යාපන, වානිජ හා වෘත්තීය ක්ෂේත්‍රවල පුළුල් ඉඩ ප්‍රශ්තා විවර වී ඇති වත්මන් යුගයේ චීන භාෂාව ඉගෙන ගැනීමෙන් විපුල ඵල ලබා ගැනීමට ශ්‍රී ලාංකිකයින් පෙළඹවීම හා ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබාදීමට සහාය වීම සඳහා ක්‍රියා කිරීම ශ්‍රී ලංකා - චීන මිත්‍රත්වය වෙනුවෙන් කැපවන සියළු මිතුරන්ගේ වගකීමකි.

මෙම සද්කාර්ය සඳහා ශ්‍රී ලංකා - චීන සමාජ හා සංකෘත්ක සහයෝගිතා සංගමය ආරම්භයේ සිටම කටයුතු කර ඇත. 1998 වර්ෂයේ බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව චීන භාෂා ශිෂ්‍යත්ව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කොට ඇත. එවකට බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යවරයාවූ වත්මන් බණිජ සම්පත් සංවර්ධන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා සහ අප සංගමයේ නිර්මාත‍ෘ ඉන්ද්‍රානන්ද අබේසේකර මැතිතුමන් ගේ ප්‍රධානත්වයෙන් ඉහත ව්‍යාපෘතිය ආරම්භකොට ඇත. නැවතත් 2003 වර්ෂයේදී කොළඹ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර විද්‍යාලයේදී චීන භාෂා පංති ආරම්භ කිරීමට එම සංගමය කටයුතු කර ඇත.

චීනයේ විදේශ භාෂා විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව කැළණිය විශ්ව විද්‍යාලයේ විදේශ භාෂා අංශය මගින් ද බණ්ඩාරණායක ජාත්‍යන්තර අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් ද චීන භාෂාව ඉගැන්වීමේ කටයුතු සිදුකෙරේ.

චීන රජයේ සෘජු මැදිහත්වීම මත චීනයේ කොන්ෆියුසියස් මූලස්ථානයට සමග සමබන්ධවී චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සේවය විසින් ශ්‍රී ලංකාවට ලබා දී ඇති කොළඹ 05, ලුම්බිණි විද්‍යාලයේ පිහිටුවා ඇති ලුම්බිණි විද්‍යාලීය CRI කොම්පියුසියස් පංතිය අප රටේ දැනට ක්‍රියාත්මකවන විධිමත් චීන භාෂා අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස විශාල කාර්ය භාරයක් ඉටුකරයි.

අංග සම්පූර්ණ චීන භාෂා පරිගණකාගාරයක්, සහිත මෙම මධ්‍යස්ථානය චීන ජාතික සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවරුන්ගේ සහ ශ්‍රී ලංකික චීන ගුරුවරුන්ගේ සහයෝගීත්වයේන් සතිය පුරා චීන භාෂා පංති රැසක් ක්‍රියාත්මක කරයි. ශිෂ්‍යයන්, වැඩිහිටියන් සහ වෙනත් අවශ්‍යතා ඇති අය සඳහා ද සුදුසු පාඨමාලා මෙහිදී පැවැත්වේ. මීට අමතරව ප්‍රධාන පාසල් කිහිපයක භාෂා පංති ආරම්භ කොට ඇති අතර, චීන භාෂාව ඉගෙන ගැනීමට උපකාරිවන පොත්පත් ඇතුළත් පුස්තකාල පොත් ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක කෙරේ. අප රටේ චීන භාෂාව ඉගෙන ගැනීමට උනන්දුවක් දක්වන සැමට මෙම මධ්‍යස්ථානය සමග සම්බන්ධවී මෙන් ඉතා පහසුවෙන් එම අවස්ථාව ලබා ගත හැකිය.මෙම ව්‍යාපෘතියේ අපගේ ප්‍රධාන ඉලක්ක කණ්ඩායම වන්නේ මේ රටේ දරුපරපුරයි. දැනුම මුල්කරගත්, තරගකාරී ලෝකයට අප දරුපරපුර සූදානම් කිරීමෙදී, චීන භාෂාව අපේ දරුවන් ලොකයේ ඉහලින් ඔසවා තබන්නට පුලුවන් තවත් ප්‍රබල සාධකයක් වන බව අපගේ විශ්වාසයයි.

විදේශ භාෂාවක් ලෙස චීන භාෂාව ඉගෙන ගැනීමෙන් ඉපැරණි සංස්කෘතියකට හිමිකම් කියන චීනයේ අසිරිමත් සංස්කෘතිය හඳුනා ගැනීමට ද ඔබට අවස්ථාව ලැබෙනු ඇත. චීන භාෂාව ඉගෙන ගෙන, චීනය දකින්නට එමගින් ලෝකය දකින්නට ඔබ සැමට ඇරයුම් කරන්නෙමි.

නන්දසේන මදවන්ආරච්චි

විධායක ගරු සභාපති
ශ්‍රී ලංකා චීන සමාජ හා සංස්කෘතික සහ සහයෝගීතා සංගමය

උපදේශක මණ්ඩල සභාපති
ශ්‍රී ලංකා-චීන ජාත්‍යන්තර ගුවන් විදුලි අසන්නන්ගේ සංගමය

අධ්‍යක්ෂ මණ්ඩල සමාජික
ලුම්බිණි විද්‍යාලීය
CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය

චීන ජාත්‍යන්තර විකාශන ජාලය

(China International Broadcasting Network CIBN)

චීන ජාත්‍යන්තර විකාශන ජාලය හෙවත් CIBN මාධ්‍ය ජාලය පසුගිය ජනවාරි 18 වෙනි දින චීනයේ බෙයිජිං හී, චීන ජාත්‍යන්තර ගුවන් විදුලි මධ්‍යස්ථානයේදී විවෘත කෙරුණි. මෙම නව ජාත්‍යන්තර විකාශන ජාලය භාෂා 61 කින් සිය විකාශන කටයුතු සිදුකරනු ලබයි. ලෝකයේ සියළුම ග්‍රාහකයින් වෙනුවෙන් විවිධ භාෂාවලින් හා විවිධ රාජ්‍ය මට්ටමේ සංවිධාන හරහා විකාශන කටයුතු සිදුකරයි. අන්තර්ජාල හා ජංගම දුරකථන භාවිතා කරන්නන්වෙනුවෙන් මෙය විශේෂත්වයක් ගන්නා බව චීන ජාත්‍යන්තර විකාශන ජාලය සඳහන් කරයි. එසේම CRI සජීවී අන්තර්ජාලය, ලොව විශාලතම භාෂාවලින් සමන්විත අන්තර්ජාල වෙබ් අඩවි, ජංගම විකාශන රූපවාහිනී ඉන්ටර්නෙට් ප්‍රොටෝකොල් ටෙලිවිෂන් (Internet Protocol Television) අන්තර්ජාල රූපවාහිනී හා චීන බහුමාධ්‍ය ජංගම විකාශන මගින්ද මෙහි විකාශනයන් ග්‍රහනය කිරීමට හැකියාව ලැබේ.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල් වංගෙතියන් මහා CIBN විවෘත කල අවස්ථාව

චීනය පිළිබඳව ලෝකයට හඳුන්වාදීමත්, ලොකය චීනයට හඳුන්වාදීමත්, චීන ජාත්‍යන්තර විකාශන ජාලය ස්ථාපිත කිරීම අරමුණයි. දේශපාලන, ආර්ථික, ක්‍රීඩා, සංස්කෘතික, සංචාරක, සමාජ හා චීනය පිළිබඳව ලෝකයට හැදෑරීම ඇතුළු විවිධ කරුණු මෙම මාධ්‍ය ජාලය හරහා ලබාගත හැකිය.

CRI ශ්‍රාවක සමාජ පිහිටුවීම

චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සිංහල සේවය හෙවත් CRI ශ්‍රී ලංකා Fm 102 නාලිකාව. Fm තරංග සහ කෙටි තරංග SW ඔස්සේ විකාශනය කෙරේ. එමෙන්ම www.cri.com අන්තර්ජාලය හරහා ලොව සතර දෙස සිටින සෑම ශ්‍රී ලාංකිකයෙකුටම ශ්‍රවනය කිරීමට අවස්තාව ලැබේ.

ශ්‍රී ලංකාවේ චීන ජාත්‍යන්තර ගුවන් විදුලය අසන්න්ගේ සංගමය මගින් දිවයින පුරා ශ්‍රාවක සමාජ පිහිටුවා තිබෙන අතර ඔබත් සමාජයක් පිහිටුවීමට අදහස් කරන්නේ නම් නම, ලිපිනය, හා දුරකථන අංකය ලියූ තැපැල් පතක් පහත ලිපිනයට යොමුකරන්න.

CRI ශ්‍රී ලංකා Fm 102, තැ.පෙ. 1774. කොළඹ.

CRI Delegation to Sri Lanka.

Mr Prof Li Zhongshang, Vice editor-in-chief ,CRI

Mr. Wang Xiaodong, Director Sinhala Service, CRI

Ms Lixuan, Director , International Cooperation Office, CRI

Luo Lin Pin , Deputy Director , Research Center, CRI

Miss HuangXiaofang , Staff Member CRI

ශ්‍රී ලංකා චීන මිත්‍රත්වයට චීනයෙන් පිදෙන අපූරු තෑග්ග

මේ දිනවල කොළඹ ගමන් කරන විට අපූරු ගොඩනැගිලි නිර්මාණයක් ඔබට දැකගන්නට ලැබෙනි. නිවැරදිවම සඳහන් කලොත්, එනම් ජෝන්ද සිල්වා සමරු රඟහලත් කලාභවනත් එක පැත්තකින්ද සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය තවත් පැත්තකින්ද, මාර්ග අංක 177 බස් මාර්ගයේ පිහිටා තිබෙන මෙම අපූරු නිර්මාණාත්මක ගොඩනැගිල්ල දැන් ඔබේ සිහියට නැගෙනු ඇත. කොළඹ මෙවන් අපූරු ගොඩනැගිලි නිර්මාණ කිහිපයක් තිබෙන අතර, අගනුවර අලංකාරයට එක්වන මේ අළුත්ම නිරමාණය නම් ශ්‍රී ලංකා චීන ප්‍රසංගික කලා මධ්‍යස්ථානයයි. පොළොන්නරුවේ සුප්‍රසිද්ධ නෙළුම් පොකුණේ ආකෘතියට නිර්මාණය කෙරුණු මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකා චීන මිත්‍රත්වයට ලැබුණු අපූරු තෑග්ගකි.

වර්ග මීටර් 14000 ක භූමියක නිර්මාණය වූ ප්‍රසංගික කලා රඟහල් සංකීර්ණය චීනයේ බෙයිජිං වාස්තු විද්‍යා අධ්‍යාපන ආයතනයේ නිර්මාණයකි. 2005 වසරේදී චීන රාජ්‍ය හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකරගත් ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රසංගික කලා රඟහල ඉදිකිරීමට අවශ්‍ය කටයුතු යෙදුනි. ශ්‍රී ලංකාවේ සංස්කෘතික කලා කටයුතු අමාත්‍යංශය මගින් මෙහි සියළුම සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවනු ලබයි. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් සඳහා විශාල සහයක් ලබාදෙන චීනයේ සුප්‍රසිද්ධ යැංජියන් සමාගම මෙය ඉදිකිරීම භාරව කටයුතු කරන අතර, 2008 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කෙරුණි.

ප්‍රසංගික කලා මධ්‍යස්ථානයේ සම්පූර්ණ ඉදිකිරීම් සඳහා වැයවන මුදල රුපියල් මිලියන 3080 හෙවත් චීන යුවාන් මිලියන 150.8 කි. ඒ සියළුම මුදල් චීන රජය මගින් සපයන අතර ඉන් සියයට 40ක් හෙවත් රුපියල් මිලියන 1232 ක් චීන ආධාර වශයෙන් ලැබේ. ඉතිරි සියයට 60 හෙවත් රුපියල් මිලියන 1848 පොලී රහිත ණය ආධාර යටතේ හිමිවේ. චීන රජයේ මූල්‍යාධාර මත ඉදිකරන නොරොච්චෝලේ තාප බලාගාරය, හම්බන්තොට මාගම්පුර ජාත්‍යන්තර වරාය, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල, වැනි තවත් දැවැන්ත ව්‍යාපෘතියක් ලෙස ප්‍රසංගික කලා මධ්‍යස්ථානය ඉදිකිරීම හැඳින්විය හැකිය.

ප්‍රසංගික කලා මධ්‍යස්ථානය මහල් 5 කින් සමන්විතය. හෙක්ටයාර 2.17 ක් පුරා වර්ග මීටර් 14000 කින් සමන්විත වන ලෙස මෙම ගොඩනැගිල්ල ඉදිකර තිබේ. ආසන 1288 කින් යුත් මෙම රඟහල තුළ වාහන 260 පමණ නවතා තැබිය හැකි ලෙස රථගාලක්ද ඉදිකර තිබේ. මෙය විශේෂත්වයකි. ශ්‍රී ලංකා බොහෝ රංගශාලාවල මෙන්ම සිනමාහල් වල පවා රථවාහන නවතා තැබීමට විශාල ඉඩකඩක් නොමැත.

ප්‍රසංගික කලා මධ්‍යස්ථානය තුල නවීන අපනශාලාවක්, ලොකයේ භාවිතා කරන අති නවීන ශබ්ද පරිපාලන පද්ධතියකින්ද සමන්විතය. විදුලිබලයෙන් ක්‍රියාත්මක කෙරෙන නවීන වේදිකාවක්ද ඉදිකර තිබේ. මෙම රංගශාලා සංකීර්ණයේ ඉහළම මහල එළිමහන් රංගපීඨයක් ලෙස නිර්මාණය කර තිබීම නිසා එය මෙරට කලාකරුවන්ට අපූරු අත්දැකීමක් වනු ඇත. මෙයට අමතරව නවීන තාක්ෂණය මුසුකල ආලෝක කරණ පද්ධතියක් සහ පරිගණක හා අභ්‍යන්තර කැමරා පද්ධතියක්ද සවිකර තිබේ. මෙම රඟහල වායුසමීකරණය කර ඇත.

ටී.බී. ඒකනායක
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය

ලැබෙන පහසුකම් -

ශ්‍රී ලංකා හා විදේශීය කලා කරුවන් නිර්මාණ එළි දැක්වීමට අවස්ථාව.

උසස් පුහුණුවීම් සඳහා අවස්ථාව.

ප්‍රසාංගික කලාවට නවීන තාක්ෂණය එක්කර ඒවා වැඩිදියුණු කිරීමට අවස්ථාව.

චිනය හා ශ්‍රී ලංකාව අතර සංස්කෘතික හුවමාරුව.



සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය ටී.බී. ඒකනායක මහතා මෙම රංගශාලා සංකීර්ණය ඉදිකිරීම පිළිබඳව අදහස දක්වමින් ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාව හා චීනය අතර මිත්‍රත්වය වෙනුවෙන් තම සවර්ණමය යුගය දැන් ආරම්භවී ඇති බවයි. එසේම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සවාධීන හා ස්ථාවර විදේශ ප්‍රතිපත්තිය නිසාවෙන් චීනය සදාතනික මිතුරන් වී සිටින බවයි.

《每měi日rì汉hàn语yǔ》

එදිනෙදා චීන බස

第di三sān课kè 祝zhù你nǐ生shēng日rì快kuài乐lè
3වැනි පාඩම -- ඔබට සුබ උපන් දිනයක් වේවා

ෂෙංලි : ආයුබෝවන් ප්‍රිය අසන්නෙනි! එදිනෙදා චීන බස වැඩසටහනින් නැවත ඔබව හමු වන මා ෂෙංලි
කස්සප: 你nǐ好hǎo! මම කස්සප
ෂෙංලි : පසුගිය වැඩසටහනින් අපි ස්තූතිය පළ කිරීමේ විධි ඉගෙන ගත්තා. මතකද කොහොමද චීනෙන් ස්තුතියි කියන්නේ කියලා ?
කස්සප: 谢xiඩ谢xiඩහරි 谢xiè谢xiè你nǐකියලා නේද ?
ෂෙංලි : හරි, එතකොට එස්තූති කරන්න එපා කියලා කියන්නේ ?
කස්සප: "不bව用yඔng谢xiඩ,
ෂෙංලි : චීනෙන් සමාවෙන්න කියලා කියන්නේ ,对duඞ不bu起qǐ"
කස්සප: "对duඞ不bu起qǐ"
ෂෙංලි : ඔයාට මතක ද ඒක සුළු දෙයක් නෙ! එහෙම නැත්නම් එඒකට කමක් නෑ වගේ විනීතව ප්‍රතිචාර දක්වන්නේ කොහොමද කියලා ?
කස්සප: මට මතක විදිහට නම් ,没mඩi关guān系xi, එහෙම නැත්නම් ,没mඩi事shඞ儿er" කියලා නේද ?
ෂෙංලි : හරියටම හරි, එහෙම නම් හොඳට මතක් වෙන්නත් එක්ක අපි පහුගිය සංවාද වලට ආපහු සවන් දෙමු නේද ?

完整对话සම්පූර්ණ සංවාදය

对话一：පළමු සංවාදය
A: 非fēi常cháng感gǎn谢xiè! ඔයාට බොහොම ස්තූතියි!
B: 不bú用yòng谢xiè! ස්තූති කරන්න එපා!

对话二：දෙවන සංවාදය
A: 对duì不bu起qǐ。 සමාවෙන්න.
B: 没méi关guān系xi。 කමක් නෑ ඒක සුළු දෙයක් නෙ!
A: 对duì不bu起qǐ。 සමාවෙන්න.
B: 没méi事shì儿er。 ඒකට කමක් නෑ.

ෂෙංලි : හොඳයි අපි ඒ මතක් කර ගත්තේ පහුගිය පාඩමයි. දැන් අද පාඩමෙන් අවධානය යොමු කරන දේවල් මොනවද කියලා මුලින්ම බලමු.

今日关键
අද පාඩමෙන් අවධානය

祝zhù你nǐ生shēng日rì快kuài乐lè!
ඔබට සුබ උපන් දිනයක් වේවා!
干gān杯bēi!
ජය වේවා!
你nǐ的de电diඊn话huඊ号hඊo码mǎ是shඞ多duō少shǎo?
ඔයාගේ දුරකථන අංකය මොකක්ද ?

ෂෙංලි : අපිට අද යාළුවෙකුගේ උපන්දින සාදයකට යන්න වෙලා සාදයක් ? කොච්චර හොඳද ? එතකොට දැන් සාදයට ගියාට පස්සේ 'ඔබට සුබ උපන් දිනයක් වේවා!' කියලා චීනෙන් කියන්නෙ කොහොම ද ?
ෂෙංලි : ඔයාට පුළුවන් ,祝zhව你nǐ生shēng日rඞ快kuඊi乐lඩ! " කියලා කියන්න
祝zhව你nǐ生shēng日rඞ快kuඊi乐lඩ
ෂෙංලි : 祝zhවකියන්නෙ 'ප්‍රාර්ථනා කරනවා' කියන අදහස
කස්සප: 祝zhව
ෂෙංලි : 你nǐකියන්නේ 'ඔයා'
කස්සප: 你nǐ
ෂෙංලි : 生shēng日rඞකියන්නේ 'උපන් දිනය'ට
කස්සප: 生shēng日rඞ
ෂෙංලි : 快kuඊi乐lඩකියන්නේ 'සුබ' එහෙම නැත්නම් 'සතුට'
කස්සප: 快kuඊi乐lඩ
ෂෙංලි : අපි ටිකක් හෙමින් ආපහු සැරයක් ඒ වාක්‍ය කියමු. 祝zhව你nǐ生shēng日rඞ快kuඊi乐lඩ
කස්සප: 祝zhව你nǐ生shēng日rඞ快kuඊi乐lඩ
ෂෙංලි : හෝඳයි හොඳයි, ඉතින් මේ විදිහට කවුරු හෝ ඔබට සුබ පැතුවාම 谢xiè谢xiè කියලා උත්තර දෙන්න මතකයි නේද ? අපි දැන් බලමු එදිනෙදා භාවිතයේදි කොහොමද මෙය යොදා ගන්නේ කියලා

对话一：
පළමු සංවාදය
A：这zhè是shì我wǒ妹mèi妹mèi。今jīn天tiān是shì她tā生shēng日rì。
මේ මගේ නංගී. අද ඇගේ උපන්දිනය.
B：祝zhù你nǐ生shēng日rì快kuài乐lè！
ඔයාට සුබ උපන් දිනයක් වේවා!
C：谢xiè谢xiè！ ස්තුතියි.

ෂෙංලි : ඊළඟට
කස්සප: සමාවෙන්න, අපි සාමාන්‍යයෙන් උපන්දිනය දවසට තාලෙට සිංදුවක් වගේ නෙ සුබ පැතුම කරන්නේ. ඉතින් චීනෙන් එහෙම කියන්නේ නැද්ද ?
ෂෙංලි : කොච්චර හොඳද මතක් කළ එක, අපිත් කියන්නේ සිංදුවක් වගේ තමයි. ඉන්න අපි ඒක අහමු දැන්.
කස්සප: හොඳයි හොඳයි
祝zhù你nǐ生shēng日rì快kuài乐lè！
ෂෙංලි : දැන් නම් ගොඩක් වෙලාවට චීන මිනිස්සුත් උපන්දින සාද පවත්වනවා තමන්ගේ ඥාති හිත මිත්‍රයොත් එක්ක.
කස්සප: දැන් උපන්දිනයට සවුදිය පුරන කොට අපි නම් කියන්නේ 'ජය වේවා' කියලා. එතකොට චීනෙන් ?
ෂෙංලි : ඔයාට පුළුවන් 干gān杯bēi කියන්න
කස්සප: 干gān杯bēi
ෂෙංලි : 干gān කියන්නෙ 'හිස් කරනවා', වේලනවා වගේ අදහසක්
කස්සප: 干gān
ෂෙංලි : 杯bēi කියන්නෙ කෝප්පය
කස්සප: 杯bēi
ෂෙංලි : දැන් අපි ඒ සම්බන්ධ සරල සංවාදයකට සවන් දෙමු
对话二：
දෙවන සංවාදය
A：干gān杯bēiජය වේවා!
B：干gān杯bēiජය වේවා!
කස්සප: මට තේරුණා. 干gān杯bēiකියලා කිව්වාම මටත් පුළුවන් 干gān杯bēi කියලාම ප්‍රතිචාර දක්වන්න. එහෙම නේද ?
ෂෙංලි : හරියටම හරි
කස්සප: සාදය අවසානේදි සමුගන්න කොට අලුතින් දැන හඳුන ගත්ත මිතුරන්ගේ දුරකථන අංකය ඉල්ල ගන්න ඕනෙ නෙ. ඉතින් ඒක කොහොමද චීනෙන් කියන්නේ ?
ෂෙංලි : ඔයාට තියෙන්නේ 你nǐ的de电diàn话huà号hào码mǎ是shì多duō少shǎo කියලා අහන එකයි
කස්සප: 你nǐ的de电diàn话huà号hào码mǎ是shì多duō少shǎoඒක නම් ටිකක් දිගයි නෙ. වචනෙන් වචනෙ පැහැදිලි කරලා දෙන්න පුළුවන් ද?
ෂෙංලි : පුළුවන්. 你nǐ的de කියන්නේ ඔයාගේ කියන එකට
කස්සප: 你nǐ的de
ෂෙංලි : 电diàn话huà කියන්නේ දුරකථනයට
කස්සප: 电diàn话huà
ෂෙංලි : 号hào码mǎ කියන්නේ 'අංකයට'
කස්සප: 号hào码mǎ
ෂෙංලි : එතකොට电diàn话huà号hào码mǎකියන්නේ දුරකථන අංකය
කස්සප: 电diàn话huà号hào码mǎ
ෂෙංලි : මොකක් ද කියලා කියන්නේ 是shì多duō少shǎo
කස්සප: 是shì多duō少shǎo
ෂෙංලි : අපි ටිකක් හෙමින් ආපහු සැරයක් ඒ වාක්‍ය කියමු. “你nǐ的de电diàn话huà号háo码mǎ是shì多duō少shǎo”
කස්සප: 你nǐ的de电diàn话huà号hào码mǎ是shì多duō少shǎo?
ෂෙංලි : අපි දැන් සංවාදයට සවන් දෙමු. බලන්න ඔබට ඒ වචන හඳුනා ගන්න පුළුවන් ද කියලා?

CRI ශ්‍රී ලංකා FM 102 වැඩසටහන ඇසුරෙන්
සම්පාදනය: **සුංජියා ජියා**

ඉතිරි කොටස මීළඟ කලාපයෙන්....

ලෝකයේ වැඩිම පිරිසක් භාවිතා කරන භාෂාව ඉගෙන ගන්න

ලෝකයේ වැඩිම පිරිසක් එකම රටක භාවිතා කරන භාෂාව කුමක්ද කියා විමසුව හොත් ඔබට නිතැතින්ම සහියට නැගෙන්නේ කුමක්ද? නිසැකවම ඒ චීනය සහ මැන්ඩරින් භාෂාවයි, මිලියන 1320 චීනයේ වෙසෙන අතර මෙයට අමරතව ලෝකයේ තවත් රාජ්‍යයන් රැසක චීන භාෂාව කථාකරන ප්‍රමාතය සියයට 20 ක් පමණ වෙනවා. ඒ අනුව මිලියන 1020 කට ආසන්න පිරිසක් චීන භාෂාව පරිහරනය කරනවා. ලෝකයේ සමස්ථ ජනගහනය මිලියන 6200 ක් පමණ වෙනවා.

විද්වතුන් ප්‍රකාශ කරන්නේ ලොව නොනැසී පවතින ජීවිය භාෂාවන් අතර, චීන භාෂාවට හිමිවන්නේ සුවිශේෂී තැනක් බවයි. ඒ අනුව තවත් වසර 20 ක් පමණ ගතවන වන විට චීන භාෂාව සමස්ථ ලෝකයේම ව්‍යාප්ත වන බවත්, ඇතැම් භාෂාවන් මල භාෂාවන් බවට පවත්වන බවයි.

මේ නිසා චීන භාෂාව ඉගෙන ගැනීම් වැදගත්කම වර්තමාන ලෝකය අවබෝධ කර ගෙන තිබේ. ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල පමණක් නොව, ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා ආදි රටවල චීන භාෂාව අධ්‍යයනයට පහසුකම් සපයා තිබේ. චීනයේ හන්බන් **(Hanban)** ආයතනය චීන භාෂාව ලොව පුරා අධ්‍යයනය කිරීමට පිහිටුවා තිබෙන ප්‍රධාන මධ්‍යස්ථානයයි. එම මධ්‍යස්ථානයේ ප්‍රධානත්වයෙන්, චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ද **(China Radio International -CRI)** චීන භාෂාව හා සංස්කෘතික අධ්‍යයනය කිරීමට අවශ්‍ය පසුබිම සලසනවා.

ශ්‍රී ලාංකීය සිසුන්ට චීන භාෂාව හා සංස්කෘතිය අධ්‍යයනය කිරීම සඳහා චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ද **(CRI)** මගින්, කොන්පියුසියස් මධ්‍යස්ථානය කොළඹ 05. ලුම්බිණි විද්‍යාලයේ ආරම්භ කලේ 2008 වර්ෂයේ දී කොළඹ පිහිටි ඉතාමත් කීර්තිමත් විද්‍යාලයක් වන ලුම්බිණි විද්‍යාලය තුල තිබෙන ඉගෙනීමට අවශ්‍ය පරිසරය හා නවීන භාෂාගාර පහසුකම් හේතුවෙන් **(CRI)** කොන්පියුසියස් මධ්‍යස්ථානය අද දිවයිනේ ප්‍රධාන චීන භාෂාව හා සංස්කෘතිය අධ්‍යයනය ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත්ව තිබේ.මෙයට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබෙන්නේ නොමද සහයකි.

මධ්‍යස්ථානයේ ඉගෙන ගත් සිසුන් කිහිපදෙනෙකු චීනයේ විශ්ව විද්‍යාලවල වැඩිදුරටත් අධ්‍යාපනය ලබමින් සිටි.

එසේම වාර්ෂිකව චීනයේ විවිධ කදවුරු සදහා සිසුන් යොමුකර තිබේ. මෙම භාෂා හා සංස්කෘතික මධ්‍යස්ථානයෙන් සැපයෙන සේවාවන්.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ කොන්ෆියුසියස් ආයතනයේ අධීක්ෂණය යටතේ ලුම්බිණි විද්‍යාලයීය CRI **කොන්ෆියුසියස් මධ්‍යස්ථානය මගින් මෙහෙයවන පහත පාඨමාලාවන් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

ජේ.පී. අමරජීව විධායක උපසභාපති
ලුම්බිණි විද්‍යාලයීය **CRI**
කොන්ෆියුසියස් මධ්‍යස්ථානය

චීන භාෂාව පිළිබඳ පදනම් පාඨමාලාව

- **කාලය** මාස 06
- **මාධ්‍ය** සිංහල/ඉංග්‍රීසි
- **ස්ථානය** ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මාධ්‍යස්ථානය ලුම්බිණි විද්‍යාලය කොළඹ 05.
- **වේලාව** ඉරිදා / සෙනසුරාදා
- **කා සඳහා ද** පාසල් සිසුන් / වැඩිහිටියන්
- **පාඨමාලා අරමුණ** චීන භාෂාව පිළිබඳව මූලික හැකියාවන් ලබාදීම

චීන භාෂාව පිළිබඳ විශේෂ පාඨමාලාව

- **කාලය** මාස 03
- **මාධ්‍ය** සිංහල/ඉංග්‍රීසි
- **ස්ථානය** ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මාධ්‍යස්ථානය ලුම්බිණි විද්‍යාලය කොළඹ 05.
- **වේලාව** ඉරිදා / සෙනසුරාදා
- **කා සඳහා ද** රාජ්‍ය ආයතනවල/පෞද්ගලික ආයතනවල සේවයේ නියුක්තවූවන් හා සංචාරක ව්‍යාපාරයේ නිරතවූවන්.
- **පාඨමාලා අරමුණ** චීන භාෂාව පිළිබඳව මූලික හැකියාවන් ලබාදීම

චීන භාෂාව පිළිබඳ උසස් පාඨමාලාව

- **කාලය** වසරයි
- **මාධ්‍ය** සිංහල/ඉංග්‍රීසි
- **ස්ථානය** ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මාධ්‍යස්ථානය ලුම්බිණි විද්‍යාලය කොළඹ 05.
- **වේලාව** ඉරිදා / සෙනසුරාදා
- **කා සඳහා ද** චීන භාෂාව පිළිබඳ පදනම් පාඨමාලාව සමත්වූවන්.
- **පාඨමාලා අරමුණ** චීන භාෂාව පිළිබඳව උසස් හැකියාවන් ලබාදීම

ඉල්ලුම්කරන ආකාරයන්

නම, ලිපිනය සේවා ස්ථානය සේවා ස්ථානයේ ලිපිනය රැකියාව දුරකථන අංක ඇතුලත් අයදුම්පත්

විධායක උප සභාපති
ලුම්බිණි විද්‍යාලයීය CRI
කොන්ෆියුසියස් මධ්‍යස්ථානය,
ලුම්බිණි විද්‍යාලය,කොළඹ 05.
ලිපිනයට එවිය යුතුය-

දුරකථන/ෆැක්ස්	011 2589747
වැඩි විස්තර	
අමරජීව	077 9213368
තිලක්	077 6403686
සුං පියා පියා	072 6536661
මදවන්ආරච්චි	071 8571290
මධුශාන්	071 4925151

CRI ශ්‍රී ලංකා FM 102 නාලිකාව තුලින් සිව්භාෂා වික්‍රමයක් සිදු කරනවා.

වං සියාඕතුං-අධක්ෂ චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සිංහල සේවය, හා CRI ශ්‍රී ලංකා FM 102

Mr. Wang Xiaodong,
Director Sinhala Service, CRI

ලොව ප්‍රධාන පෙලේ විද්‍යුත් මාධ්‍ය ජාලයත්, වැඩිම භාෂා ප්‍රමාණයකින් විකාශනය කරන මාධ්‍ය ආයතනයත් කුමක්දැයි ඔබගෙන් ඇසුවහොත් ඔබට හිතැනින්ම සිහියට නැගෙන්නේ ආසියාවේ රටක් පිළිබඳවයි....ඔබ ලෝකය පිළිබඳව දැනුවත් වී සිටියා නම් ඔබගේ මතකය අවධිකරන්නේ අන් කිසිම රටක් නොව චීනයයි....එහෙම නම් චීනයේ කුමන මාධ්‍ය ආයතනයද.......... ඒ චීන ජාත්‍යන්තර ගුවන් විදුලියයි. වර්තමානයේ දී චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය තව් පුළුල් වී තිබෙන අතර චීන ජාත්‍යන්තර විකාශන ජාලය හෙවත් **CIBN (China Intenational Broadcasting Network)** ලෙසද දැවැන්තව ව්‍යාපත්ව තිබේ. ලොව ප්‍රසිද්ධ භාෂා 61 කින් මෙහි විකාශන කටයුතු සිදු කරයි.

අප අද කථා කරන්නේ චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය යටතේ තිබෙන සිංහල සේවය ගැනයි.

එනම් චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සිංහල සේවය හෙවත්, **CRI** ශ්‍රී ලංකා **FM 102** නාලිකාව ගැනයි. මේ කථාව විශේෂත්වයක් ගන්නවා. එයට හේතුව තමයි මා ශ්‍රිලාංකිකයෙක් ලෙස, චීන ජාතිකයෙක් සමග සිංහලෙන්ම මෙම සංවාදය පැවැත්වීමයි. ඔහුට අපූරුවට සිංහල භාෂාව මනාව හැසිරීමේ දක්ෂතාවයක් තිබෙනවා..... නමින් ඔහු වං සියාඕතුං **(Wang Xiaodong)**, තනතුරින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සිංහල සේවය, හා **CRI** ශ්‍රී ලංකා **FM 102** නාලිකාවේ අධක්ෂවරයායි.

• වං මහත්මයා.... මම මුලින්ම දැනගන්න කැමතියි ඔබ මෙතරම් සිංහල භාෂාවට කැමති ඇයි කියලා

ඇත්ත වශයෙන්ම සිංහල භාෂාව ලොව භාවිතා කරන භාෂා අතර කලාත්මක භාෂාවක් සිංහල භාෂාව මගින් අපූරු නිර්මාණ කරන්න පුළුවං. විශේෂයෙන් සිංහල භාෂාව සමස්ත සමාජයේම හිතසුව පිණිස උපත ලද භාෂාවක් හැටියට සලකන්න පුළුවං. ඒවගේම තමයි මම සිංහල භාෂාව ඉගෙන ගන්න තියෙන කැමැත්ත නිසා, 1984 දි බෙයිජිං විදේශ භාෂා විශ්වවිද්‍යාලයට ඇතුළුවුනා. එතනදී සිංහල භාෂාව ඉගෙන ගත්තා. ඒවගේම තමයි මම දිගුකාලයක සිට ශ්‍රී ලංකාව ගැන අධ්‍යාපනය කලා. සිංහල භාෂාව වගේම මම ඉංග්‍රීසි භාෂාවත් අධ්‍යයනය කලා. මගේ මව් භාෂාවට වගේම මම සිංහල භාෂාවටත් හරිම කැමතියි.

අද මම සිංහල භාෂාවෙන් උපරිම ප්‍රයෝජන ගන්නවා. සිංහල සේවයේ අධ්‍යක්ෂ තනතුර දැරීමට ප්‍රධානම හේතුව වුනේ මගේ සිංහල දැනුම. මෙම සඟරාවේ වගේම අපගේ සිංහල අංශය මගින් ප්‍රකාශයට පත් කරන .සුභාසර. සඟරාවෙන් විධායක සංස්කාරක ලෙසත් කටයුතු කරනවා. මගේ සිංහල දැනුම නිසා මට ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවල මිතුරන් රැසක් සිටිනවා. එය මට ආඩම්බරයට කාරණයක්. සිංහල භාෂාව ඉගෙන ගැනීම නිසා අපි අතර මනා සන්නිවේදන සබඳතාවයක් පවත්වාගෙන යාමට හැකිවී තිබෙනවා.

ඒවගේම මම ශ්‍රී ලංකාවේදීත් සිංහල භාෂාව අධ්‍යයනය කලා. ඒ කැලණිය විශ්ව විද්‍යාලයේදී 1992 සිට 1993 දක්වා කාලය තුල කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ බෞද්ධ හා පාලි භාෂා අධ්‍යයන ආයතනයේ දි

• අද වන විට ඔබ ඉතා සාර්ථකවුත් . දීර්ඝවුත් ගමනක් ඇවිත් තිබෙනවා. ඔබගේ මාධ්‍ය ජීවිතය පිළිබඳව මතකය අවදිකලොත්...

මගේ මාධ්‍ය ජීවිතය ගැන සඳහන් කරන විට මගේ මතකයට නැගෙන්නේ මම චීන ජාත්‍යන්තර ගුවන් විදුලියට (CRI) බැඳුනේ. 1989 දී. 1989 සිට මම CRI එකේ සේවය කලා වසර 5 ක් පමණ. ඒ කියන්නේ 1992 වෙනකං. මා ඔබට කලින් කිව්වේ 1992 දි මම ශ්‍රී ලංකාවට ගියා කියලා. ඒ CRI එකෙන් මාව වැඩිදුර අධ්‍යයනය කරන්න ඒ කියන්නේ සිංහල භාෂාව ප්‍රගුණ කරන්න. ඔබ දන්වා මම ලංකාවේ 1993 වෙනකං හිටිය කියලා. පසුව මම නැවත CRI එකට ආවා. මේ ආකාරයට මම CRI එකට මගේ දැනුම උපරිම අන්දමින් යොදෙව්වා. මට භාරදුන් රාජකාරි මම උපරිමයෙන්ම ඉටුකලා. එහි ප්‍රතිඵලයක් ලෙස මෙහෙ පාලක මණ්ලයට CRI සිංහල අංශයේ අධ්‍යක්ෂ ධුරයට පත් කලා. ඒ 1999 වසරේදී. එදා සිට අද දක්වා මම එහි අධ්‍යක්ෂ ලෙස කටයුතු කරනවා.

• සිංහල සේවය හෙවත් අද වන විට CRI ශ්‍රී ලංකා FM 102 යනුවෙන් හඳුන්වන නාලිකාව ගැන කථා කලොත්.

කියන්න ඉතාම සතුටුයි. මගේ දිගු බලාපොරොත්තුවක් තිබුනා. එයින් සියයට 50ක් දැං සැබෑවෙලා. ඒ තමයි අපේ ශ්‍රී ලාංකික අසන්නන්ට FM නාලිකාවක් හරහා පැහැදිලි ශ්‍රවණ තත්වයකින් විකාශන කටයුතු සිදුකරන්න. මේ සඳහා මම ලංකාවේ විවිධ නාලිකා සමග සාකච්ඡා කලා. මේ සඳහා කාලයක් ගත වුනා. මේ සඳහා අපි විශාල මුදලක් ආයෝජනය කරන්නත්, උපකරන ලබාදෙන්නත් කැමැත්තෙන් හිටියේ. නමුත් අපිට ගැලපෙන, අපේ ගිවිසුම්වලට සුදුසු ආයතනයක් හමුවුනේ නැහැ.

කෙසේ වෙතත් 2009 වසරේදී අපිට VIS කියන ශ්‍රී ලංකාවේ ආයතනය සමග ගිවිසුමකට එළඹෙන්න අවස්ථාව ලැබුනා. VIS ආයතනය හරහා අපගේ FM 102 සේවාව විකාශනය කරන්න අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කලා. අපි නවීන උපකරන දැනට ලෝකයේ භාවිතා කරන උසස්ම උපකරන අපි සපයා දුන්නා. ඒ අනුව 2010 වසරේදී අපිට හැකියාව ලැබුනා නාලිකාව ආරම්භ කරන්න. 2010 වර්ෂයේ FM 102 නාලිකාව ආරම්භ කරන්න.

2010 වර්ෂයේ ජූලි මස 02 වෙනි දා අපි නිලවශයෙන් CRI ශ්‍රී ලංකා FM 102 නාලිකාව ආරම්භ කලා. ඒ අනුව ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය දි. මු. ජයරත්න, හා CRI අධ්‍යක්ෂ ජනරාල් වං ගෙන්නියන් (Wang Gengnan) යන මහත්වරුන් ප්‍රධානත්වයෙන් සහ ශ්‍රී ලංකාවේ මැති ඇමතිවරුන් ප්‍රමුඛ ප්‍රභූන් සහ අප රටේ උසස් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ආරම්භක උත්සවය ඉතා චමත්කාරව අපි සංවිධානය කලා. එය අප හදවත්තුල සදා මතකයක්ව තිබෙනවා.

CRI ශ්‍රී ලංකා FM 102 නාලිකාව තුලින් සිව්භාෂා වික්‍රමයක් සිදු කරනවා. මම හිතන්නේ එය ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවයට සිදුවන්නේ කියලා. සිංහල, දෙමළ, ඉංග්‍රීසි හා චීන භාෂාවෙන් අපි විකශන කටයුතු කරනවා. සිංහල වැඩසටහන් දිනපතාම පෙරවරු 11.30 සිට පස්වරු 1.30 දක්වාත් නැවත පස්වරු 5.30 සිට 7.30 දක්වාත් විසුරුවා හරිනවා. දැනට අපගේ විකාශනයන් බස්නාහිර පලාතටම ඇහෙනවා. කොළඹ, කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්කවලට ඉදිරියේ දී සමස්ත ශ්‍රී ලංකාවටම අහෙන්න සලස්වනවා. කෙසේ වෙතත් අප මීට පෙර කෙටි තරංග මාලාවක් ඔස්සේ විකාශනය කලා. FM 102 ආරම්භ වුවත් සුපුරුදු පරිදි අපි කෙටි තරංග විකාශනයන් කරනවා. එසේම www. cri. cn. යන අන්තර්ජාල වෙබ් අඩවිය මගිනුත් සවන් දෙන්න පුළුවං.

• එතකොට වං මහත්තයා ඔබගේ වැඩසටහන්වල වෙනසක් ඇති කලා ද?

ඔව් කාලයට ගැලපෙන ලෙස අපි වැඩසටහන් වෙනස් කලා. වැඩසටහන්වල අන්තර්ගතය මෙන්ම වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරයත්

වෙනස් කලා. කෙසේ වෙතත් නිවැරදි ලෙස සිංහල භාෂාව හැසිරවීමට අපි වගබලා ගන්නවා. සතියේ දවස් හතේම එකිනෙකට වෙනස් වැඩසටහන් නිෂ්පාදනය කරනවා. මේ සියළුම වැඩසටහන්වල අන්තර්ගතය පිළිබඳව මා නිරන්තරව සොයා බලනවා. ඒක නිසා ශ්‍රී ලාංකික අසන්නන්ට උසස් වැඩසටහන් රසවිඳින්න අවස්ථාව ලැබී තිබෙනවා.

සාකච්චාකොට සකස්කළේ
මධුශාන් කුලරත්න

Most Popular
Ancient Chinese Musical Instruments

China is located in the distant Far East. For million of years, the yellow Rivers and Changjiang (Yangtze) River have traversed this land like two strings on a musical instrument, ceaselessly reverberating to an ancient and beautiful melody. From this Environment has emerged China's vibrant and diverse musical culture, exemplified by a dazzling array of Chinese musical instruments.

Musical instruments are specialized implements for producing sound. The Primitive musical instruments used by early humans were no more than household articles and tools of production that were capable of producing some musical sounds. At that time, the daily life and productive actives of humankind. With the evolution of human society and increasing productive capability, early humans gradually leamed to create specialized devices for making music. Far back in prehistory, the Chines ancestors were already fashioning a wide array of musical instruments. Archeological excavations have revealed that prehistoric musical instruments were made primarily of bone, pottery, and stone. Bamboo, wood, or hide may also have been used, but it is highly unlikely that instruments made from such ephemeral materials are still in existence. Prehistoric musical instruments that have survived to the present day include wind instruments, such as bone flutes and whistles, pottery xun (Chines ocarina), and pottery homs; as well as percussion instruments such as pottery rattles and drums, stone chimes, and large and small pottery bells, it is apparent that most of these artifacts were used specificly for making music , and thus can be considered true musical instruments.

Archeologists have excavated an unusual rattle - type instrument from ancient gravesite in Ganusu Province. A hollow ellipsoid vessel made of fired yellow clay, it has a burnished surface incised on one side with cnss-cross lines. Inside the body are a number of hard pellets that produce a rustling sound when the instruments is shaken. This artifact is 6000 t0 7000 years old, dating from China's Yangshao Culture (c. 5000-4000BC) . Similar pottery ratteies have been excavated from a number of Neolithic sites in China. Most of them are spherical in shape, although some are shaped like boxes, discs, or animals. One type, known as the "sounding Jar", resembles a double walled water jar with clay pellets between the layers. Musical archeologists generally refer to these instruments as pottery rattles. They are characterized by hollow bodies pierced with holes and incised with geometrical designs on the surface, and contain clay pellets or small stones that make noise when shaken. Since the sound Produced is not very loud, it is believed that these rattles functioned as imbuements worn by dancers, similar to decorative bells. A number of pottery rattlehave also been excavated from ancient children's gravesites, suggesting that they may have served as children's toys. Actually. there was not necessarily a clear division between toys and musical instruments at the dawn of human of civiliztation. even today certain musical instruments, such as the niao xun (bird-shaped rattle), are commonly played with by children regardless of whether the ancient pottery rattle was an ornament worn by dancers or a children's toy, it is certain that it produced sounds for entertainment. Musicologists therefore regard it as a true early musical instrument.

චීන ජාත්‍යන්තර ආර්ථික හා ව්‍යාපාරික විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කණ්ඩායම
Chinese UIBE Art Troupe in Sri Lanka 2011
中国对外经贸大学2011斯里兰卡演出团



1. 2. 3. චීන අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් ශ්‍රී ලංකා චීන තනාපති කාර්යාලය, ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය හා CRI ශ්‍රී ලංකා Fm 102 නාලිකාව ඒකාබද්ධව සංවිධානය කරන ලද චීනයේ අක්ෂාංශ 30˚ දෙපස සංස්කෘතිය විදහා දැක්වෙන ඡායාරූප ප්‍රදර්ශනයට එක්වූ අමාත්‍යවරුන් වන අතාවුද සෙනෙවිරත්න, ඩිලාන් පෙරේරා, නියෝජ්‍ය අමාත්‍ය ගීතාංජන ගුණවර්ධන සහ චීන තනාපති කාර්යාලයේ කවුන්සල හන් වාඕ යන මහත්වරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී ව සිටියහ.

4. චීන අක්ෂර ඇඳීමේ කලාව හඳුන්වාදීමේ අවස්ථාවට එක්වූ ශ්‍රී ලංකාවේ චීන තනාපති කාර්යාලයේ පලමු ලේකම් හා සංස්කෘතික අංශ ප්‍රධානි ෂෙං මිං මහතා හා සිසුන්.

5. කොළඹ සංඝමිත්තා විද්‍යාලයේ පැවති චීන ආහාර සැකසීමේ වැඩසටහනේදී එම විද්‍යාලයේ විදුහල්පති විනීතා ජයවීර මහත්මියගේ උපදෙස් හා සංවිධානය මත, ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලය, සංඝමිත්තා CRI ශ්‍රාවක කවය, LACRI, ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය හා CRI ශ්‍රී ලංකා Fm 102 නාලිකාව මෙය සංවිධානය කළේය.

6. චීනයේ බීජිං නුවර පැවති පස්වන කොන්ෆියුසියස් ආයතන සමුළුව නියෝජනය කළ, ශ්‍රී ලංකාවේ නියෝජිතයන් (වමේසිට) ලුම්බිණි විද්‍යාලයීය CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ විධායක උපසභාපති (විදුහල්පති) ජේ.ජී. අමරජීව මහතා එම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂිකා සුංජිය ජියා මෙනෙවිය හා අධ්‍යක්ෂ (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්) නන්දසේන මදවන්ආරච්චි මහතා.